# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 333/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 24/02/2024 පැය 1340

## මාධ්‍ය නිවේදනය

### 01. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - තංගල්ල පොලිස් වසම.

2024.02.23 වන දින සවස් කාලයේදී තංගල්ල පොලිස් වසමේ නාකුළුගමුව මාවැල්ල ධීවර වරායේ නැංගුරම් මධ්‍යස්ථානයේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට තංගල්ල පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර තිබිණි.

අතුරුදහන් වූ පුද්ගලයා ඔහුගේ පුතා සමඟ ඉහත සඳහන් ස්ථානයේ දිය නාමින් සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇති අතර මෙම අයගේ මෘත ශරීරය ප්‍රදේශවාසීන් විසින් සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ මහවත්ත, නාකුළුගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - දඹුල්ල පොලිස් වසම.

2024.02.23 වන දින සවස් කාලයේදී දඹුල්ල පොලිස් වසමේ කිරිඉබ්බන්කොටුව ජලාශයේ දියනෑමට ගිය පිරිමි ළමයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට දඹුල්ල පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ දාම්වල ජනපදය, හල්විටිගල ප්‍රදේශයේ පදිංචි පාසල් සිසුවෙකි.**

මරණකරු තවත් පිරිසක් සමඟ ගාල්ල ප්‍රදේශයේ සිට සීගිරිය නැරඹීමට විනෝද චාරිකාවක් සඳහා පැමිණ ඉහත සඳහන් ස්ථානයේ දිය නාමින් සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇත.

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කළුතර උතුර පොලිස් වසම.

2024.02.24 වන අද දින අළුයම් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ වස්කඩුව, කොන්ගස් හන්දිය ප්‍රදේශයේදී කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේදී කළුතර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් අතුරු මාර්ගයකට හරවන අවස්ථාවේදී කොළඹ දෙස සිට කළුතර දෙසට ධාවන වූ ලොරි රථයක ගැටී ත්‍රීරෝද රථය ඉදිරියට ඇදී ගෙන ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථ රියදුරු හා එහි පිටුපස ගමන් ගත් ඔහුගේ බිරිඳ බරපතල තුවාල ලබා කළුතර රෝහලට ඇතුලත් කිරීමේදී ත්‍රීරෝද රථ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ මහ වස්කඩුව, වස්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකර ලොරි රථයේ රියදුරු පලා ගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**